**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව - 2021**

**-----------------------------------------**

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

------------------------------------

1.1 දැක්ම

-------

උතුරේ ජනතාවගේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ලඟාකර ගැනීමට අරමුණු කර ගැනීම.

1.2 මෙහෙවර

------------

යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීමත් සමග සේවා හා පහසුකම් නැවත සක්‍රීය කිරීම මගින් ජීවනෝපාය ගොඩනැගීම සහ උතුරේ ජනතාවගේ මානව සම්පත් ධාරිතාවන් සංවර්ධනය කිරීම ඉලක්ක කර ගැනීම.

1.3 කාර්යභාරය

--------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සමගාමී ලැයිස්තුවේ සහ පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇත.

2. මුළු ප්‍රතිපාදනය හා වියදම

----------------------------

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 34,395.40ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 31,389.64ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3,005.76ක් හෙවත් සියයට 8.74ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2021 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 28,534.00 | 27,523.50 | 1,010.50 | 3.54 |
| මූලධන | 5,861.40 | 3,866.14 | 1,995.26 | 34.04 |
| එකතුව | 34,395.40 | 31,389.64 | 3,005.76 | 8.74 |

3. විගණන නිරීක්ෂණය

------------------------

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.